# සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව

## දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

## රුහුණ විශ්වවිද්‍යාලය

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය-2014

බෞද්ධ සංස්කෘතිය,

බෞසංප්‍ර 1.1 - භාරතීය බෞද්ධ සංස්කෘතික ඉතිහාසය

කථිකාචාර්ය ආර්. මලවි පතිරණ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
mpranjanee@gmail.com

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

## 1. බුදුසමයේ ප්‍රභවය කෙරෙහි බලපෑ දේශපාලන පසුබිම

- ප්‍රාග් බෞද්ධ භාරතීය දේශපාලනය ක්‍රියාකාරීත්වය
- ක්‍රි.පූ. 6 වන සියවස වන විට භාරතයේ ක්‍රියාත්මක වූ දේශපාලන ව්‍යුහය
- බෞද්ධ සමාජ දර්ශනය සමකාලීන ආර්ථික, දේශපාන තත්ත්වය පාදක කොටගෙන ඉදිරිපත් වීම.
- ත්‍රිපිටකාගත සාහිත්‍යයේ, වේද සාහිත්‍යයේ සඳහන් තොරතුරු
- පූර්ව වෛදික යුගයේ දී වෛදික ආර්යයන් වයඹදිග ඉන්දියාවට ප්‍රවේශ වී ක්‍රම ක්‍රමයෙන් තම ගෝත්‍රික රාජ්‍යයන්හි බලය තහවුරු කර ගැනීම හා පරිපාලන සංවිධාන ද සංවිධානය කර ගැනීම.
- ක්‍රමයෙන් නැගෙනහිර ඉන්දියාවට හා දකුණු ඉන්දියාවට සංක්‍රමණය වන විට මුල් ගෝත්‍ර නාම වෙනස් වී වෙනත් ගෝත්‍ර නාම පවා ආරූඪ වීම.

  උදා: පුරු ගෝත්‍රය } කුරු
  භරත ගෝත්‍රය }

  සර්වාස ගෝත්‍රය } පංචාල
  කිවි ගෝත්‍රය }

- ක්‍රි.පූ. 8 වන සියවසේ පෞරව අධිරාජ්‍යයේ අවසාන අධිරාජ්‍යයා වූ නිචක්ෂු ගංගා නදියේ ඉහළ තීරයේ වූ හස්තිනා පුරය ගංවතුරෙන් විනාශ වූ බැවින් එම අගනගරය අතහැර දමා යමුනා ගංගා තීරයෙහි පිහිටි කෞශාම්බි හෙවත් කොසඹෑ නුවර අගනගරය කර ගැනීම.
- ප්‍රාදේශීය පාලකයෝ කුඩා කුඩා රාජ්‍යයන් වෙන් කරගනිමින් ස්වාධීනව නැගී සිටීම.

  උදා : කුරු, පංචාල, , විදේහ, සිවි, මද්ද, මල්ල, ගාන්ධාර, කාම්බෝජ, දණ්ඩක, කාසි, කෝසල, අස්සක, වජ්ජි, කේත, මච්ඡ, සුරසේන, අංග, මගධ, අවන්ති, කාලිංග, දසණ්ණ, සෝවීර, සුරට්ඨ, මහිංසක, සේරිව, අන්ධ, සාකේත, කෞශාම්බි, කුසාවතී.

- ක්‍රි.පූ. 6 වන සියවස වන විට රාජාණ්ඩු හා සමූහාණ්ඩු (ගණතන්ත්‍ර) වශයෙන් සංවිධානය වීම.
- කාබුල් නදියේ සිට දක්ෂිණ භාරතයේ උතුරු සීමාව වූ ගෝධාවරී දක්වා විහිදී ගිය ජනපද 16ක් නිර්මාණය වීම.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

1. අංග
2. මගධ
3. කාසි
4. කෝසල
5. වජ්ජි
6. මල්ල
7. චේති
8. වත්සය
9. කුරු
10. පංචාල
11. මච්ඡ
12. සූරසේන
13. අවන්ති
14. අස්සක
15. ගාන්ධාර
16. කාම්බෝජ

- රාජාණ්ඩු සතර - මගධ, කෝසල, වත්සය, අවන්ති
- ප්‍රබල සමූහාණ්ඩු - වජ්ජි, මල්ල

  වජ්ජීන් අනුගමනය කළ සප්ත අපරිහානී ධර්ම බුදු රජාණන් වහන්සෙගේ ඇගයීමට ලක් වීම.

- බුදුරජාණන් වහන්සේ හා සමකාලීන භාරතීය පාලකයන් අතර සබඳතා

## 2. බුද්ධ චරිතය

- ක්‍රි.පූ. හයවන සියවසේ (ක්‍රි.පූ 623) නේපාලයේ (උතුරු ඉන්දියාවේ) උපත ලැබීම.
- පරිනිර්වාණය සිදු වන විට (ක්‍රි.පූ. 543) වයස අවුරුදු 80 කි. (මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රය, දීඝනිකාය - මහාපරිනිබ්බාන සූත්‍රය)
- "මහණෙනි, මේ මහා භද්‍රකල්පයෙහි ම මෙකල මම අර්හත් සම්බුද්ධ වෙමි... මම ජාතියෙන් ක්ෂත්‍රියව ක්ෂත්‍රිය කුලයෙහි උපනිමි. ගෝත්‍රයෙන් ගෞතම නම් වීමි... මෙකල මාගේ ආයු ප්‍රමාණය අල්පය. ටිකය. යමෙක් බොහෝ කල් ජීවත් වෙයි නම් ඔහු අවුරුදු සියයක් හෝ ටිකක් වැඩියෙන් හෝ අඩුවෙන් ජීවත් වෙයි. මෙකල අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ මම ඇසතු රුක්මුල්හි බුදුවීමි... මෙකල මට සාරිපුත්ත, මොග්ගල්ලාන නම් අග්‍ර භද්‍ර ශ්‍රාවක යුග්මයක් වෙති... මෙකල මට රහතන් වහන්සේලා ම එක් දහස් දෙසිය පනසක් වූ එකම ශ්‍රාවක සන්නිපාතයක් විය. ආනන්ද භික්ෂුනට අග්‍ර උපස්ථායක විය... සුද්ධෝදන රජ පියා විය... මායා දේවිය වැදූ මව වූවාය... කපිල වත්ථුව රාජධානිය යි..." - දීඝනිකායේ මහාපදාන සූත්‍රය.
- උපත ලුම්බිනියේදී සිදු වූ බව - "අසම උතුම් රත්නයක් වැනි ඒ බෝසතාණෝ මිනිස් ලොව හිතසුව පිණිස ශාක්‍ය ජනපදයෙහි ලුම්බිණි ග්‍රාමයෙහි උපන්හ." - සුත්ත නිපාතය, මහාවග්ගය, නාලක සූත්‍රය, අශෝක රජුගේ රුම්න්දෙයි ටැම් ලිපිය

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

- ශාක්‍ය වංශයේ උපන් බව බිම්බිසාර රජුට පැවසීම - සුත්ත නිපාතය, මහාවග්ගය, පබ්බජ්ජා සූත්‍රය.

- පියා සුදොවුන් රජු බවත් ගුරුවරයා අසිත තාපසයා බවත් සඳහන් කිරීම. - සුත්ත නිපාතය, මහාවග්ගය, නාලක සූත්‍රය.

- මව මායා දේවිය බවත් ප්‍රජාපතිය සුළු මව බවත් සඳහන් කිරීම. - ථෙරීගාථා, පජාපතී ගෝතමී ථෙරීගාථා, අපදානපාළි, අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ ගෝතමී වග්ගයේ ගෝතමී සූත්‍රය, මජ්ඣිම නිකායේ දක්ඛිණ විභංග සූත්‍රය.

- නම් තැබීමේ දී හා අසිත තවුසා වැඳුම් කළ අවස්ථාවේ දී ඉපදුණු දින සිට බුදුවන ලක්ෂණ දක්නට ලැබුණු බව සඳහන් වීම.

- තමා ගිහි ජීවිතයේ විඳි සැපය පිළිබඳව ප්‍රකාශ කිරීම. - "මහණෙනි, මම සියුමැලි වෙමි, පරම සියුමැලි වෙමි. මහණෙනි, මාගේ පියාගේ නිවසෙහි පොකුණු තනවා තිබිණි..." - අංගුත්තර නිකායේ දේවදූත වග්ගය

- රාහුල පුතු පිළිබඳව සඳහන් කිරීම. - මහාවග්ගපාලියේ රාහුල වත්ථුකථා.

- යශෝධරා පිළිබඳව සඳහන් කිරීම. - අපදාන පාළියේ යසෝධරාපදානය

- බුද්ධත්වය අපේක්ෂා කරමින් බවුන් වැඩීම - අංගුත්තර නිකායේ තික නිපාතය, සම්බෝධි වග්ගය.

- පඤ්චස්කන්ධය පිළිබඳව ප්‍රඥාවෙන් අවබෝධ කර ගන්නා තුරු තමා සම්මා සම්බුද්ධ යැයි ප්‍රකාශ නොකළ බව - සංයුත්ත නිකායේ ඛන්ධ සංයුත්තය, පඨම අස්සාද සූත්‍රය, දුතිය අස්සාද සූත්‍රය, තතිය අස්සාද සූත්‍රය, යමක වග්ගයේ සම්බෝධ සූත්‍රය, දුතිය සම්බෝධ සූත්‍රය, පඨම දුතිය අස්සාද පරියේසණ සූත්‍රය

- ගිහිගෙය හැරදමා පැවිදි වීමට අදහස් කිරීම. - ".....ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, සංකිලෙස ස්වභාවයන්ගෙන් තොර අනුත්තර යෝගක්ෂේම නම් වූ නිර්වාණය සොයන්නෙම් නම් මැනවි." - මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රය, මහාසච්චක සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය, පබ්බජ්ජා සූත්‍රය, දීඝනිකායේ මහානිදාන සූත්‍රය, දසුත්තර සූත්‍රය

- දෙමාපියන් හඬද්දී ගිහිගෙයින් නික්මුණු බව, මජ්ඣිම නිකායේ, අරියපරියේසන සූත්‍රය, මහාසච්චක සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය

- කුසලය සොයමින් ගවේෂණය කළ බව - මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රය, මහාසච්චක සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය

- පධන් වීර්යය වැඩූ බව - මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රය

- බුද්ධත්වය ලැබීමට වෙහෙසුණු බව - "දතින් දත තද කොට දිවෙන් තල්ල මැඩගෙන කුසල් සිතින් අකුසල් සිත නිග්‍රහ කළොත් යමෙක් කළොත්, පෙළවහොත් මැනවැයි මට සිතිණ." - මජ්ඣිම නිකායේ මහාසච්චක සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය, මහාසීහනාද සූත්‍රය

- බුද්ධත්වයට පත් වූ බව - "මහණෙනි, මා විසින් අප්‍රමාදයෙන් බෝධිය ලබන ලදී. අනුත්තර නිර්වාණය ලබන ලදී..."- අංගුත්තර නිකායේ වස්සූපනායික වග්ගයේ උපඤ්ඤායක සූත්‍රය, උදාන පාළියේ, ප්‍රථම දුතිය බෝධි සූත්‍රය, මහාවග්ගපාළියේ මහාඛන්ධකය, සංයුත්ත නිකායේ මාරසංයුත්තයේ පඨම දුතිය පාස සූත්‍රය

- සුජාතාවගේ (ප්‍රථම) දානය - අංගුත්තර නිකායේ ඒතදග්ගපාළි

- චුන්දගේ (අවසාන) දානය - දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රය

- මිනිස් ස්වභාවය -"මම දැන් දිරා ගිය මහල්ලෙක්මි. මගේ වයස අසූවකි. ශරීරය දිරාගිය කරත්තයක් මෙනි."

- පරිනිර්වාණයට පත්වීම *"හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදේථා."*- දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රය

- අන්‍යාගමිකයන්ගේ පවා ඇගයීමට පාත්‍ර වීම. *උදා-* කූටදන්ත බ්‍රාහ්මණයාගේ ප්‍රකාශය

  ✓ සත්මුතු කුලපරම්පරාව දක්වා මවුපිය දෙපාර්ශවයෙන් ම පිරිසිදු ය. *"උභතො සුජාතො මාතිතො ච පිතිතො ච සංසුද්ධ ගහණිකො...."*

  ✓ විශාල නෑ පිරිසක් හැරදමා පැවිදි වූහ. - "මහන්තං ඤාතිසංඝං පහාය පබ්බජිතො"

  ✓ විශාල ධනස්කන්ධයක් හැරදමා පැවිදි වූහ. - "පහූතං හිරඤ්ඤ සුවණ්ණං පහාය පබ්බජිතො"

  ✓ ජීවිතයේ ප්‍රථම වයසේ හිරිමල් වියේදී ම පැවිදි වූහ. "..දහරො ච සමානො යුවා සුසුකාළ කෙසා භද්‍රෙන යොබ්බනෙ සමන්නාගතො පඨමෙන වයසා අගාරස්මා අනගාරියං පබ්බජිතො"

  ✓ මව්පියන් අකමැත්තෙන් හැඬූ කඳුලෙන් පසුවෙද්දී කෙස් රැවුල් බා කසට වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම පැවිදි වූහ. "අකාමකානං මාතා පිතූනං අස්සුමුඛානා රුදන්නානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡා දෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො.."

  ✓ මනා රූප ශෝභාවකින් හෙබි උන්වහන්සේ හමුවීම අපහසු නැත. "අභිරූපො දස්සනීයො අබුද්දාව දස්සනා ය."

  ✓ මහා චරිතයකින් හෙබි එතුමෝ සීල සම්පන්න ය.-"සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො"

  ✓ පැහැදිලි අර්ථවත් මනොඥ ශිෂ්ටසම්පන්න වචන කථා කරති."කල්‍යාණවාචා කල්‍යාණ වාක්කරණ පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගළාය අත්ථදස්ස විඤ්ඤාපනීයා.."

  ✓ සුපේෂල ශික්ෂාකාමී ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පාරාවක උදාර වූ ආචාර්යවරයෙකි."බහුන්නං ආචරියපාචරියො"

  ✓ කාමරාගයෙන් චපල බව්න් මිදුන සේක."ඛීණ කාමරාගො විගතචාපල්ලො"

- ✓ ජනතාවගේ යහපත ඉතසිතින් කැමතිව හොඳ නරක කියා දෙන සේක."කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤාය පජාය."

- ✓ උසස් කුලයෙන් පැවිදි වූ කෙනෙකි. "උච්චාකුල පබ්බජිතො"

- ✓ මහා සම්පත් ඇති කුලයකින් පැවිදි වු කෙනෙකි. - "අඩ්ඪා කුලා පබ්බජිතො"

- ✓ දේශ දේශාන්තරයෙන් ප්‍රශ්න විචාරීමට පිරිස් පැමිණෙති.

- ✓ දෙවිවරු දහස් ගණනින් උන් වහන්සේ සරණ යති.

- ✓ නව අරහාදී ගුණයන්ගෙන් කීර්තිරාවය පැතිර ගොස් ඇත.

- ✓ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණවලින් යුක්තයහ.

- ✓ බැහැදැකීමට පැමිණෙන්නවුන් සාදරයෙන් පිළිගන්නා සේක. ඔවුන් හා සතුටු සාමිචියෙහි යෙදෙන සේක. අමනාප බව හඟවමින් බැම නොහකුළුවන සේක. විවෘත මුහුණකින් කථා කරන සේක. අන් අය කථා කරන තෙක් නොසිට ප්‍රථමයෙන් ම කථා කරන සේක.

- ✓ සිව්වනක් පිරිසෙහි ම ගෞරවාදරයට පාත්‍ර වූහ.

- ✓ බොහෝ දෙව්මිනිසුන්ගේ පැහැදීමට පාත්‍ර වී සිටිති.

- ✓ උන් වහන්සේ යම් ගමක වාසය කරයි නම් එම ගමෙහි මිනිසුන්ට අමනුෂ්‍යයන්ගෙන් කරදර කිසිවක් සිදු නොවේ.

- ✓ ආගමික නායකයන් අතර ශ්‍රේෂ්ඨය.

- ✓ උන් වහන්සේගේ චර්යාව නිසා අනෙකුත් ශාස්තාවරුන්ට වඩා කීර්තිරාවය පැතිර ඇත.

- ✓ බිම්බිසාර, පසේනදී කෝසල රජවරුන්, පොක්ඛරසාතී බ්‍රාහ්මණ යනාදී උසස් පුද්ගලයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇත.

- ✓ උන් වහන්සේගේ ගුණ ප්‍රමාණ කළ නොහැකි ය.

- මිනිස් ජීවිතයක සංවර්ධනය කර ගත යුතු මානව දයාව හා කරුණාව, මානුෂිකත්වය, නිශ්ශරණාධ්‍යාශය, මානව සංවේදනය වැනි උතුම් ගුණයෙන් උන් වහන්සේගේ චරිතය ප්‍රභාවිත විය.

    - ✓ මනුෂ්‍යයන් අතර භේද නොමැති බව පෙන්වා දුන්හ.

    - ✓ තමාට වැළඳී තිබු දරුණු රෝගය වීර්යයෙන් යටපත් කරගෙන තවත් සුළු කාලයක් ජීවත් වීමට සිතුවේ භික්‍ෂූන් වහන්සේලා අමතා පිරිනිවන් පෑමට සිතු බැවිනි.

    - ✓ ආනන්ද හිමියන්ගේ සේවය අනෙක් අය ඉදිරියේ ප්‍රශංසාවට ලක් කළහ.

    - ✓ ඡන්න භික්‍ෂුවගේ හිතසුව පිණිස බ්‍රහ්ම දණ්ඩනය පැනවීම

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

- ✓ පිරිනිවන් පෑමට පෙර ධර්මය හා විනය පිළිබඳව කිසියම් කුකුසක් තිබේ නම් යහළුවෙකු මගින් හෝ විමසන්නැයි ප්‍රකාශ කිරීම අවසන් හුස්මේදි පවා සුභද්‍ර පැවිදි කිරීම.
- ✓ ධර්මය දායාද කොටගෙන ධර්මයෙහි හැසිරෙන්නැ'යි අවවාද දීම.
- ✓ බුදු දහම පිළිගැනීමට පෙර වෙනත් ආගමිකයන්ට කළ යුතු පුද පූජා සත්කාර එලෙසම කරන්නැයි කීම.
- ✓ සෞන්දර්යයට සංවේදී වීම. - දීඝනිකායේ සක්කපඤ්ඤ සූත්‍රය, "ආනන්දය විශාලා නුවර රමණීය යි, උදේන චේතිය රමණීය යි. -දීඝනිකාය මහාපරිනිබ්බාන සූත්‍රය

## 3. අශෝක අධිරාජ්‍යයා

- භාරතයේ මහා අධිරාජ්‍යයක් බිහි කළ මෞර්ය රාජවංශයේ ආදී පීතෘවරයා වූයේ චන්ද්‍රගුප්ත ය.
- ක්‍රි.පූ. 324 සිට 24 වසරක් රාජ්‍ය කොට ක්‍රි.පූ 300 දී මිය ගියේ ය.
- අනතුරුව ඔහුගේ පුත් බින්දුසාර (අමිත්‍රඝාත - සතුරු මරුවා) රාජ්‍යත්වයට පත්වේ. ඔහු පුත් අශෝක මගධ රජ්‍යයේ බලයට පත් වන්නේ ක්‍රි.පූ. 273 දී ය. ඔහු දේවි නම් ශාක්‍ය කුමරිය සරණ පාවා ගනියි. කුඩා කාලය පිළිබඳ තොරතුරු දුලබය.
- 'දේවානම්පිය පියදස්සි අසෝක' නමින් රජ වෙයි. අභිෂේකයෙන් 8 වැනි වසරෙහි කාලිංග රාජ්‍ය තමා සතු කර ගැනීමේ අභිලාෂයෙන් සටන් කොට ජයගනී යි. එයින් ළතැවුලට පත් වේ. - 13 වන ගිරි ලිපිය
- විහාර යාත්‍රාවෙහි යෙදෙමින් දිග්විජය (රටවල් දිනීම) කළ අශෝක එය අතහැර ධර්ම යාත්‍රාවෙහි යෙදෙමින් ධර්ම විජය කළේ ය. සුමන නම් වූ සිය දෙටු සොහොයුරාගේ පුත් නිග්‍රෝධ රහත් සාමණේරයන් වහන්සේගේ ධර්මය අසා බෞද්ධයෙකු බවට පත් විය."බුධසි ධංමසි සංඝසි ති ශාලාව චං පසා දෙ ච...." - රූපනාථ ගිරි ලිපිය.
- එසේ ම ඔහු දිගු කලක් බුදු දහම පුරුදු පුහුණු කළ බව සෙල් ලිපිවල සඳහන් වේ.

  "දෙවානම්පියතිස්ස (රජ) තෙමේ මෙසේ කියයි. අවුරුදු තුනකට වැඩි කාලයක් මම ශාක්‍ය මුනීන්ද්‍රයන්ගේ ශ්‍රාවකයෙක් වීමි. එහෙත් වැඩි දියුණුවක් නොවී ය. සංඝයා වෙත එළඹ දැන් අවුරුද්දකට වැඩි ය. දියුණුව ද විපුල ය."- මස්කි ගිරි ලිපිය
- අරියවංශ සූත්‍ර, අනාගත භය සූත්‍රය, මුනි ගාථා, මොණෙය්‍ය සූත්‍රය, රාහුලෝවාද සූත්‍රය පිළිබඳව භාබෘ ලිපියෙහි සඳහන් වේ.
- ලුම්බිනියට ගොස් ගල් ටැඹක් පිහිටුවීම. ලුම්බිනිගම අය බද්දෙන් නිදහස් කිරීම
- බුද්ධගයාවට, ඉසිපතනයට, සාරානාථයට ගොස් ටැම් ලිපි පිහිටුවීම, සංඝභේදය කළ අය නෙරපිය යුතු බව සඳහන් කොට සාංචි ආදී වෙහෙර විහාර කරවා සංගායනාවක් පවා පැවැත්වීම.

- සාරානාථයෙහි සිංහසිරසෙහි ඇත්තේ අශෝක ධර්ම චක්‍රය යි. (ඉන්දියා රජයේ කොඩිය)

- ආගම් සමගිය ඇති කිරීම.

- ඔහු තම ප්‍රතිපත්ති සකස් කර ගත්තේ බෞද්ධ ආභාසයෙනි. බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි රජු නැඹුරු වූයේ ය.

- මේ යුගය වන විට බුදු සමය තුළ භක්ති මාර්ගය ඉස්මතු වෙමින් ඥාන මාර්ගය යටපත් වෙමින් තිබුණි.

- අශෝකගේ ධර්ම විජය ප්‍රතිපත්තිය පෝෂණය වූයේ බුදු සමයෙනි. එබැවින් ජනයා දහමෙහි හසුවාලීමට රණබෙර හඬ වෙනුවට ධර්ම ඝෝෂාව ඇති කළ යුතු යැයි 4 වන ගිරි ලිපියෙහි දැක් වේ.

- පරිහානියට පත්වෙමින් යන බුදු දහම නගා සිටුවීම.- ධර්ම සංගායනාව, නවරට ධර්ම ප්‍රචාරය

- දෙවියන් පවා සමගි කරවීමට සිතුවේ ය. "යා ඉයාම කාලාය ජම්බුදීපසී අමිසා දේවා හුසු තෙ දානි මිසා කටා " - රූපනාථ ගිරිලිපිය

- ඇදහීම් නිසා භින්නව සිටි මිනිසුන් මිශ්‍ර කර සමගි කිරීමට සිතුවේ ය. "ඉමිනා වූ කාලෙන අමිසා සමානා මුනිසා ජම්බුදීපසී මිසා දෙවෙ.." - බ්‍රහ්මගිරි ලිපිය

- බුද්ධ ධර්මය විදේශ රටවල ප්‍රචාරය සඳහා අනුග්‍රහය දැක්වීමෙන් තම නිලධාරී තන්ත්‍රය යොදා ගෙන ප්‍රජාව ද බුද්ධ ධර්මානුගත කිරීම.

- මව්පිය උපස්ථානයේ වැදගත්කම අවධාරණය - ගිරිලිපි 11

- ඊර්ෂ්‍යාව, කුසීතකම, ඉක්මන්කම ආදීය අවගුණය. - කාලිංග ලිපි

- සත්‍යවාදීවීමේ වැදගත්කම - බ්‍රහ්මගිරි ලිපිය

- දානය, ප්‍රිය වචනය, සත්‍යය, පිරිසිදු බව හා ආශ්‍රවයන් අඩු බව අවධාරණය කිරීම. ටැම් ලිපි 2

- මධ්‍යස්ථ, බව, පිරිමැසීම, ආත්ම දමනය, අධ්‍යාත්මික පාරිශුද්ධිය අගය කිරීම.

- පැළලුප් නුවර කිසිවෙකු සංඝයා නොබිඳවිය යුතු යැයි සඳහන් කිරීම.

- සියලු ආගමික පූජ්‍යයෝ බහුශ්‍රැත වෙත්වා යි යහපත් ධර්ම ඇත්තේ වෙත්වා යි ප්‍රාර්ථනා කිරීම - 12 ගිරිලිපිය

- ආත්ම වර්ණනාවෙන් තොරවන ලෙසත් අන්‍යාගමිකයන් පහත් කොට නොසලකන ලෙසත් ඔහු සියලු ආගමිකයන්ගෙන් ඉල්ලා සිටී - පී.වී.බාපට්, පී.සී.බග්චී, ජේ.එන් තකාසකී, වී.වී ගොචලේ, ආර්.සී මජුම්දාර්

- "අශෝකගේ ධර්ම විජය ප්‍රතිපත්තිය බෞද්ධ චක්‍රවර්ති රාජ්‍ය සංකල්පයට ළං වේ." - රායිචෞදරී

- අශෝකගේ ධර්මය බුදු දහමේ ඉගැන්වෙන ගිහි විනය හා සැසඳේ - මහාචාර්ය බරුවා

- අශෝකගේ ධර්මය බුදු සමයෙන් පෝෂණය වී ඇත. - මහාචාර්ය හුල්ට්ෂ්

- ඉට්සිං (ක්‍රි.ව. 671 - 695) භාරතයේ සංචාරයේදී සිවුරුදරා සිටින අශෝක රජුගේ ප්‍රතිමාවක් දැකීම.

## 4. නාලන්දා විශ්වවිද්‍යාලය

- මගධයේ බිහාර් ප්‍රාන්තයේ පිහිටියේ ය.
- ත්‍රිපිටක සාහිත්‍යය, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, නානක විද්‍යාත්මක සාධක මගින් ද හියුං - සියැං, ඉට්සිං, ෆාහියන් වැනි අයගේ වාර්තා මගින් ද මහාවංශය, දීපවංශය වැනි වංශ කතා මගින් ද තොරතුරු හෙළිවේ.
- නාලන්දාව දියුණු බෞද්ධ විශ්විද්‍යාලයකි. ආරම්භය (ක්‍රි.ව.415 - 455) පළමුවන කුමාර ගුප්ත (සක්‍රාදිත්‍ය) රාජ්‍ය සමය
- ෆාහියන් වාර්තා
- බුද්ධ ගුප්ත, තථාගත ගුප්තරාජ, බාලාදිත්‍යරජවරුන්ගේ අනුග්‍රහය
- හියුං - සියැං, ඉට්සිං, ෆාහියන් වැනි අය නාලන්දාවේ අධ්‍යාපනය හදාරා ඇත.
- ටිබෙට් ඓතිහාසික වාර්තා හා ශිලා ලේඛනවල දතාරානාථගේ බෞද්ධ ඉතිහාසය නම් ග්‍රන්ථයේ ද මේ පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
- **"ශ්‍රී නාලාන්දා මහා විහාරීය - ආර්ය භික්ෂු සංඝෂ්‍ය"** යන පාඨය සහිත නිල මුද්‍රාව
- බරගාඕන් (විහාරගම) නමින් වර්තමානයේ හැඳින්වේ.
- පාවාරික අඹ වනය පිහිටි ස්ථානයයි - දීඝ නිකායේ මහාපරිනිබ්බාන සූත්‍රය
- තෘප්තිමත් නොවන දානය ( න - අලන් - දා)
- නළ තොහොත් නෙළුම්වලින් ගහණ පොකුණු
- මක්බලී ගෝසාල හා ජෛන මහා වීර හමු වූයේ ද නාලන්දාවේ දී ය.
- නාගර්ජුන හා ආර්යදේව හිමිවරුන් වැඩසිටීම හා මහායානයේ ආරම්භක ස්ථානය වීම.
- නාලන්දාවේ අධ්‍යාපනය
    - ✓ ක්‍රි.ව.7 වන සියවස පමණ වන විට නාලන්දාව 10000 පමණ නේවාසික පහසුකම් තිබූ බව
    - ✓ ආචාර්යවරු 1510, මානව 150, ශිෂ්‍යයන් 7000
    - ✓ පශ්චාත් උපාධි, උපාධි අපේක්ෂිත ශිෂ්‍යයන්, ද්විතීය අධ්‍යාපනය අපේක්ෂිත ශිෂ්‍යයන්
    - ✓ සම්මුඛ පරීක්ෂණ

- ✓ විෂය මාලාව

    1. භාෂා අධ්‍යයන විෂය ධාරාව
    2. බුද්ධ ධර්මය අධ්‍යයන විෂය ධාරාව
    3. දර්ශන අධ්‍යයන විෂය ධාරාව
    4. ලෞකික විෂය අධ්‍යයන විෂය ධාරාව
    5. ලලිත කලා අධ්‍යයන විෂය ධාරාව

- ✓ පුස්තකාලය (ධම්මගඤ්ජ, රත්නෝදය, රත්නරඤ්ජන)
- ✓ මහායාන ආචාර්යවරුන්ගේ ග්‍රන්ථ රචනය
- ✓ නීත මාලාව

- විනාශය - 13 වන සියවසේ දී මුහම්මද් බඛ්තියාර් බිල්ජිගේ මුස්ලිම් ආක්‍රමණය

## 5. භාරතීය බුදුසමයෙහි පිරිහීම

- බුදු සමය පහළ වූ භාරතයෙහි ක්‍රි.ව. 4, 5 සියවස්වල සිට ක්‍රි.ව 13 වැනි සියවස වන විට බුදු දහම ශීඝ්‍රයෙන් පරිහානියට පත්වේ.
- පිරිහීමට බලපෑ ප්‍රධාන හේතු

    1. බෞද්ධයාගේ අභ්‍යන්තර දුර්වලතා
    2. මධ්‍ය කාලින ඉන්දියාවේ පැවති මිථ්‍යා විශ්වාස සමග මිශ්‍ර වීම
    3. හින්දු හා බෞද්ධ දෙපක්ෂය අතර ආගමික විශ්වාස පදනම් කොටගෙන ඇති වූ තරඟය
    4. හින්දු, බෞද්ධ සම්ප්‍රදායයන්හි බුද්ධධර්ම විරෝධී ප්‍රචාරය.
    5. මුස්ලිම් ආක්‍රමණය

- බෞද්ධයාගේ අභ්‍යන්තර දුර්වලතා.
    - ✓ බුදු දහම මගින් පෙන්වා දුන් ගුණ ධර්ම වර්ධනය කර නො ගැනීම.
    - ✓ ආගම, ආර්ථික, අධ්‍යාපනය හා සාමාජික බලපුළුවන්කාරකම් රැකදෙන හා තහවුරු කරන ආයතනයක් බවට පත් කර ගැනීම.

- මධ්‍යකාලින ඉන්දියාවේ පැවති මිථ්‍යා විශ්වාස සමග මිශ්‍ර වීම.

දර්ශන හා අධ්‍යාපන අධ්‍යයන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

- ✓ කල්පික හා වැඩවසම් ලක්ෂණ සහිත විවිධ පුද සරිත් දියුණු වීම.

- හින්දු - බෞද්ධ ආගමික විශ්වාස පදනම් කර ගෙන ඇති වූ තරඟය
  - ✓ විවිධ පුද සිරිත් බුදු සමය තුළ වැඩි දියුණු වීමට හේතුව වූයේ ද හින්දූන් හා තරඟයට බැසීම ය.
  - ✓ බුදුරජාණන් වහන්සේගේ තත්වය උසස් කොට එම තත්වය ලැබීම පිණිස පොදු ලෝකයා මෙහෙයවීම.
  - ✓ ප්‍රධාන බෞද්ධ ඉගැන්වීම්වලට පහර ගැසීම.
  - ✓ දඹදිව යනු ඉතා ගැඹුරු දර්ශන දක්නට ලැබුණු රටක් වීම.

- හින්දු - බෞද්ධ සම්ප්‍රදායන්හි බෞද්ධ විරෝධී ප්‍රචාරය
  - ✓ කුමාරිල විසින් ක්‍රි.ව. 7 වන සියවසේ වෛවදික සිරිත් විරිත්, යාග හෝම නැවත පැතිරවීමට උත්සාහ කිරීම.
  - ✓ ශංකර ආචාර්යවරයා (ක්‍රි.ව. 788 - 820) පිරිහී තිබූ වේදාන්ත දර්ශනය නැවත සකස් කොට ප්‍රචාරය කිරීම.
  - ✓ මේ වන විට නාලන්දා වැනි විශ්වවිද්‍යාල පවා දියුණු වී තිබූ නමුදු බෞද්ධයන්ගේ අත්තිවාරම ස්ථාවර නොවී ය.

- මුස්ලිම් ආක්‍රමණය
  - ✓ ප්‍රතිපත්ති හෝ මතවාද මගින් බුදු දහම අතුරුදහන් කිරීම අපහසු විය. ඒ සඳහා ප්‍රධාන හේතුව වූයේ අවි ආයුධවලින් කළ මුස්ලිම් ආක්‍රමණය යි.

- බුදු දහම භාරතයේ අතුරුදහන් වූයේ එය ප්‍රගතිශීලී ජීව බලයක් නැති දහමක් නිසා යැයි ඇතැම්හු පවසති.
- අශෝක අධිරාජයා බුදු දහම වැළඳ ගෙන අවිහිංසාවාදී වීම ද බුදු සමය පිරිහීමට හේතුවකැ'යි ඇතැම්හු පවසති. වෙනත් ආගම් ප්‍රචාරය වීමට ද රජු ඉඩදුන් බැවිනි.
- බුදු දහම භාරතයේ සමාජ පරිපර්තනයකට හේතු විය. භාරතයට බොහෝ වටිනාකම් හිමි වූයේ බුදු දහම නිසා ය. එහෙත් බ්‍රාහ්මණයන්ටත්, මුස්ලිම්වරුන්ටත් එහි අගය නො පෙණුනි.